Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - සිංහල

සතිය- 2 වන සතිය

ශ්‍රේණිය - 07

Prepared by- ගුරු උපදේශක එම්.ඩී.ආර්.මුණසිංහ

<u>ප්‍රස්තාව පිරුළු</u>

සිද්ධිමාලාව ⟶ අවස්ථාව ⟶ ප්‍රස්තාව

එනම් කිසියම් සිදුවීමකට අදාළ කතන්දරයක් පදනම් ව නිර්මාණය වූ කියමනක් ( පිරුළක්) ප්‍රස්තාව පිරුළු වේ.

**මේ සඳහා අදාළ වී ඇති කතා ප්‍රභේද**

- ජනකතා
- ජන ප්‍රවාද කතා
- සමාජයේ සිදුවන සිදුවීම් ඇසුරින්
- පරිසරයේ සිදුවන ස්වභාවික සිදුවීම් ඇසුරින්
- ජීවන අත්දැකීම් ඇසුරින්

**ප්‍රස්තාව පිරුළුවල ලක්ෂණ හා වැදගත්කම**

- උපමාන ලෙස දැක්වීම
  ( එහි උපමේය ලෙස සමාජයීය සිදුවීම් ඉලක්ක වේ.)
- “ වගේ ” යන උපමාවාචී නිපාතය බොහෝ විට භාවිත කිරීම.
- පරිසරයේ අපට සමීප වස්තු/සිදුවීම් භාවිත කිරීම.
- ගැමි බස (ග්‍රාමීය භාෂාව ) යොදා ගැනීම.
- කට වහර යොදා ගැනීමට
  ( උදා:- ලබ්බ පොළොවේ ගැහුවා වාගේ - ලබ්බ= ලබු ගෙඩිය)
  ( ලබු ගෙඩිය පොළොවෙහි ගැසුවා වැනි ය.)

අභ්‍යාස

1. ඉහත උදාහරණ පරිදි කටවහර යෙදුණු පද සහිත
   - ප්‍රස්තාව පිරුළු 05 ක් පිටපත් කර ගන්න.
   - ඒවා නූතන ව්‍යවහාර භාෂාවෙන් ලියන්න.

2. නිවසේ හෝ පාසලේ සිදුවන සිදුවීමකට අදාළ ප්‍රස්තාව පිරුළක් තෝරාගෙන කතාවක් ගොඩනගා අදාළ ප්‍රස්තාව පිරුළ යොදන්න.

රූඪී හෙවත් ඉඟි වැකි

- ❖ රූඪී ⟶ අමුතුවෙන් ආරූඪ කළ අර්ථ සහිත යෙදුම් වේ.
- ❖ පදාර්ථ/වචනාර්ථ තේරුමට වඩා හාත්පසින් ම වෙනස් අරුතක් ප්‍රකාශ කෙරෙයි.
- ❖ මතුපිට අර්ථය ඉක්මවා ගිය වෙනත් අරුතක් අඟවයි.
- ❖ සමහර රූඪී සම්බන්ධව ද කතාන්දර ගොඩ නැගී ඇත.

උදා:- හණමිටිකාරයා

වෙළෙන්දෝ දෙදෙනෙක් තම නිෂ්පාදන රැගෙන වෙළදාමේ යති. එක් එක් නගරවලට ගොස් ඔවුහු තම නිෂ්පාදන විකුණා ලබන මුදලින් හණමිටි මිල දී ගනිති. ආපසු එන ගමනේ දී එක් වෙළෙන්දකුට එම හණමිටි, තමා මිල දී ගත්තාට වඩා වැඩි මුදලකට විකිණීමට හැකිවීම නිසා ඒවා විකුණා, එම නගරයේ ලාබෙට ඇති භාණ්ඩ මිල දී ගනියි. අනෙක් වෙළෙන්දා තම හණමිටි ටික එසේ ම රැගෙන එයි. මෙසේ නගරයෙන් නගරයට එන ගමනේ රැගෙන එන භාණ්ඩ වැඩි මිලකට විකිණිය හැකි අවස්ථාවල විකුණා විශාල ලාභයක් ලබා ධනවතෙක් විය. අනෙක් වෙළෙන්දා හණමිටි ටික තම නිවසට රැගෙන විත් තම සුපුරුදු රස්සාවේ යෙදිණි. වෙනස් විදියට ධනාත්මක ව සිතා කටයුතු කිරීමෙන් දියුණු විය හැකි බවත්, ධනාත්මක ව නොසිතා කටයුතු කරන්නා එක ම තැන නවතින බවත්, ප්‍රකාශ කිරීමට හණමිටිකාරයා යන රූඪීය යොදයි.

අභ්‍යාස

1. මෙබඳු රූඪී ඇසුරින් නිර්මාණය වී ඇති කතා එකතුවක් සකසන්න.
2. ප්‍රස්තාව පිරුළු හා රූඪී ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.